# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1988 අංක 42 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 නොවැම්බර් මස 24 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1988 නොවැම්බර් මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.**

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල: ශත 60 යි. තැපැල් ගාස්තුව: ශත 75 යි.

# 1988 අංක 42 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 නොවැම්බර් මස 24 වන දින]

එල්. ඩී.—ඕ. 21/87

**1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1988 අංක 42 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. මෙහි මින්මතු " ප්‍රධාන ප්‍රඥප්තිය " යනුවෙන් හඳුන්වනු ලබන, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(අ) (ඊ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (ඊඊ) සේවායෝජකයන් විසින් මෙම පනත හෝ ඒ යටතේ සාදන ලද නියෝග කිසිවක් හෝ අනුව අදාළ වාර්තා සැපයීමට අපොහොසත් වූ නැතහොත් ඌනතා සහිත හෝ සාවද්‍ය වාර්තා සැපයීම, නිසා පෞද්ගලික ගිණුම්වලට බැර කළ නොහැකි මේ පනත යටතේ ලැබුණු දායක මුදල් බැර කළ යුතු අවිනිශ්චිත ගිණුමක් පවත්වා ගෙන යා යුතු අතර, මෙම ඡේදය බලාත්මක වන දින එවැනි දායක මුදල් සම්බන්ධයෙන් අරමුදල විසින් පවත්වාගෙන යනු ලබන ගිණුමකට අයත් සියලු මුදල් මුල්‍ය මණ්ඩලය විසින්, මෙම ඡේදය මගින් නිර්මිත අවිනිශ්චිත ගිණුමට පැවරිය යුතු ය.

ඉහත සඳහන් පරිදි අදාළ වාර්තා සැපයීමට අපොහොසත් වූ සේවායෝජකයකු විසින් ස්වකීය සේවකයා සම්බන්ධයෙන් නිවැරදි වාර්තා සපයනු ලබන විට හා එවැනි අවස්ථාවක, මූල්‍ය මණ්ඩලය විසින් අවිනිශ්චිත ගිණුමෙහි පවත්නා මුදල් සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමට පැවරිය යුතු ය.

මෙම ඡේදයෙහි විධිවිධාන සලසා ඇති පරිදි අවිනිශ්චිත ගිණුමෙන් පෞද්ගලික ගිණුමකට මුදල් කිසිවක් පවරනු ලබන අවස්ථාවක, එම පැවරීමේ දිනට පූර්වයෙන් වූ අවුරුදු හයක කාලයක් නොඉක්මවන පරිදි, එම මුදල් ලැබුනු දින සිට එම මුදල් පෞද්ගලික ගිණුමට පවරනු ලබන දින දක්වා වූ කාලය සඳහා එම මුදලට පොලියක් ගෙවිය යුතු අතර, පොලී අනුපාතය මෙම පනතේ 14 (1) වන වගන්තිය අනුව තීරණය කළ යුතු ය ; තවද පොලී අනුපාතය, එය ගෙවනු ලබන වර්ෂය සඳහා අදාළ විය යුතු ය ; " තව ද,

ඩී 000954—11,150 (88/10)

(ආ) (ඔඔ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඔඔඔ) 22 වන වගන්තිය යටතේ වූ නිවාස ණයක් මත ලැබිය යුතු හිඟ මුදල් කිසිවක්, ඒ සම්බන්ධයෙන් කොමසාරිස්වරයාගෙන් ලැබෙන නියමයක් අනුව සාමාජිකයකුගේ පෞද්ගලික ගිණුමෙන් අඩුකර ගතයුතු අතර, එසේ අඩුකර ගත් මුදල අදාළ ණය දෙන ආයතනයට පැවරිය යුතුය ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ අගට පහත දැක්වෙන අතුරු විධානය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"එසේ වුවද තවදුරටත්, 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත යටතේ පිහිටුවනු ලැබූ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් හෝ 1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවනු ලැබූ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් හෝ (401 වන අධිකාරය වූ) ජාතික නිවාස පනත යටතේ පිහිටුවනු ලැබූ සීමාසහිත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව විසින් හෝ 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ පිහිටුවන ලද මහජන බැංකුව විසින් හෝ (397 වන අධිකාරය වූ) ලංකා බැංකු ආඥාපනත යටතේ පිහිටුවන ලද ලංකා බැංකුව විසින් හෝ 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත යටතේ පිහිටුවන ලද ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් හෝ (124 වන අධිකාරය වූ) සමූපකාර සමිති ආඥාපනත යටතේ පිහිටුවන ලද විවිධ සේවා සමූපකාර සමිති විසින් හෝ නිවාස ඉදිකිරීම් කාර්ය සඳහා දෙන ලද ණයකට ප්‍රතිපක්ෂව, අරමුදලේ සාමාජිකයකු විසින්, අරමුදලේ ස්වකීය පෞද්ගලික ගිණුමේ බැරට පවත්නා දායක මුදල්, එකී ණය දෙන ආයතන අතුරින් යම් ආයතනයකට පැවරීම හෝ වැය බරක් කිරීම හෝ කළ හැකි ය.

කෙසේ වුව ද, පවුලක එක සාමාජිකයකුට වඩා වැඩි සංඛ්‍යාවක් අරමුදලේ සාමාජිකයන් වන අවස්ථාවක, එසේ සාමාජිකයන් වන එම පවුලේ සියලුම සාමාජිකයන් විසින් අරමුදලේ සාමාජිකයන් වශයෙන් ඉහත කී පරිදි ගන්නා ලද නිවාස ණයකට ප්‍රතිපක්ෂව, ස්වකීය පෞද්ගලික ගිණුම්වල බැරට පවත්නා දායක මුදල්වල මුළු එකතු මුදල පැවරීම හෝ වැය බරක් කිරීම කළ හැකි ය.

ණය මුදලක වාරිකයක් ආපසු ගෙවීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක, මෙම පනතේ 23 වන හා 24 වන වගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් වුවද ඒ ගැන නොතකා, සේවකයා විසින් එසේ පැහැර හරිනු ලැබූ වාරිකය මත උපචිත වී ඇති පොලිය ද සමග ඒ වාරිකය, අදාළ ණය දෙන ආයතන විසින් ඒ බව දැනුම් දෙනු ලැබීමෙන් පසුව, එම සේවකයාගේ පෞද්ගලික ගිණුමෙහි හෝ සේවකයන්ගේ පෞද්ගලික ගිණුම්වල පවත්නා මුදල්වලින් එම ණය දෙන ආයතනවලට කොමසාරිස්වරයා විසින් පියවිය යුතු ය.

ණය මුදලක වාරික ගෙවීම සේවානියුක්තයකු විසින් පැහැර හැරීම පිළිබඳව අදාළ ණය දෙන ආයතනයන් විසින් කොමසාරිස්වරයා වෙත දැනුම්දීම, එක් එක් ලිත් වර්ෂය අග දී කරනු ලැබිය යුතු ය.

අවස්ථාවෝචිත පරිදි, 23 වන හෝ 24 වන වගන්තිය යටතේ වූ අර්ථ ලාභයක් ගෙවනු ලබන කල්හි, ඉහත කී පරිදි ගනු ලැබූ නිවාස ණයක් හේතු කොට ගෙන හිඟ මුදල් කිසිවක් ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි එම සාමාජිකයාගේ හෝ සාමාජිකයන්ගේ බැරට ඔහුගේ හෝ ඔවුන්ගේ පෞද්ගලික ගිණුම්වල පවත්නා මුදල්වලින් එම හිඟ මුදල් අඩු කොට, එසේ මුදල් අඩු කිරීමකට ඉක්බිතිවම, එසේ අඩුකර ගනු ලැබූ මුදල් අදාළ ණය දෙන ආයතනවලට පවරන ලෙස කොමසාරිස්වරයා විසින් මූල්‍ය මණ්ඩලයට නියම කළ හැකි ය.

22 වන වගන්තියේ කාර්යය සඳහා "පවුල" යන්නෙන් අරමුදලේ සාමාජිකයෙකු, ඔහුගේ භාර්යාව හෝ ඇයගේ ස්වාමි පුරුෂයා, සහ ඔහුගේ හෝ ඇයගේ දරුවන් අදහස් වේ.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "මෙම වගන්තියේ මෙහි මින්මතු විධිවිධාන සලසා ඇති පරිදි හැර" යන වචන වෙනුවට "මෙම වගන්තියේ මෙහි මින්මතු විධිවිධාන සලසා ඇති පරිදි හැර හා 22 වන වගන්තියෙන් කර ඇති අඩු කිරීම්වලට යටත්ව" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "එවිට එම මුදල" යන වචන වෙනුවට "එවිට 22 වන වගන්තියෙන් කර ඇති අඩු කිරීම්වලට යටත්ව ; එම මුදල" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එම වගන්තියේ (2) උපවගන්තියේ "එම මුදල" යන වචන වෙනුවට "22 වන වගන්තියෙන් කර ඇති අඩු කිරීම්වලට යටත්ව, එම මුදල" යන වචන ආදේශ කිරීමෙන් ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

6. 31 වන වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 31අ වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතුය :—

"වාර්තා සැපයීමට අපොහොසත් වන සේවා යෝජකයන්ට අධිභාරයක් පැනවීම.

31අ. මේ පනත හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් අනුව යම් දායක මුදලක් සමග වාර්තාවක් සැපයීමට නියමිත යම් සේවා යෝජකයකු නියමිත කාලය ඇතුළත එම වාර්තාව සැපයීමට අපොහොසත් වන නැතහොත් සාවද්‍ය හෝ ඌනතා සහිත වාර්තාවක් සපයා ඇති අතර, තත් කාලය සඳහා එම වාර්තාව සැපයීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් කොමසාරිස්වරයා සෑහීමට පත් වන පරිදි කරුණු දැක්වීමට ඔහුට නොහැකි වන අවස්ථාවක, නිසි පරිදි සම්පූර්ණ කරන ලද වාර්තාව ශ්‍රී ලංකා මහබැංකුවට ලැබිය යුතු අවසාන දින හෝ ඊට පෙර සිට එය මහ බැංකුවට ලැබුණු දින දක්වා සෑම පූර්ණ මාසයක් හෝ එහි කොටසක් සඳහා ම එම දායක මුදලින් සියයට එක බැගින් වූ අධිභාරයක් අරමුදලට ගෙවීමට ඔහු යටත් විය යුතු ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.